# කාර්යසාධන වාර්තාව

## නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

**2015** ජනවාරි සිට දෙසැම්බර් දක්වා


නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

අංක **80, 4** වන මහල, අධිකරණ මාවත, කොළඹ **12**

**www.lawcom.gov.lk**

# නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

## ( අංක 80, 4 වන මහල, අධිකරණ මාවත, කොළඹ 12).

### 01. හැඳින්වීම.

1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව පිහිටුවන ලද අතර, ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව නීති ප්‍රතිසංස්කරණ නිර්දේශ කරනු ලබන රජයේ ප්‍රධානම ආයතනය වේ. පරිපාලනය සඳහා ත්, පර්යේෂණ සඳහා සහයෝගය ලබාදීම සඳහා ත්, නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී.

### 02. දැක්ම.

යහපාලනය උදෙසා නීතියේ ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම.

### 03. මෙහෙවර.

නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම සඳහා 1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනතේ දක්වා ඇති කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

### 04. අරමුණු සහ කාර්යයන්.

නීති කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වනුයේ, නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම වේ. එවැනි ප්‍රවර්ධන අරමුණු කරගනිමින් නීති කොමිෂන් සභාව මගින් පහත දක්වා ඇති කාර්යයන් ක්‍රියාවට නංවනු ලබයි.

I. නීතිය සංග්‍රහ ගත කිරීම.

II. නීතියේ විෂමතා නැති කිරීම.

III. හරයාත්මක නීතිය මෙන්ම කාර්ය පටිපාටික නීතියද ක්‍රමානුකූලව සංවර්ධනය කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් සමාලෝචනය කිරීම සහ පවත්වාගෙන යාම.

IV. කාලෝචිත නොවන සහ අනවශ්‍ය පනත් ඉවත් කිරීම.

V. නීතිය සරල කිරීම සහ නවීකරණය කිරීම.

VI. නීති ප්‍රතිසංස්කරණය සඳහා වන යෝජනා භාරගෙන ඒවා සලකා බැලීම.

VII. ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් නීතියේ විවිධ අංශ පරීක්ෂා කිරීම සඳහා වන වැඩසටහන් කලින් කලට සකස්කොට අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

VIII. වෙනත් රටවල නීති ක්‍රම පිළිබඳව තොරතුරු ලබා ගැනීම.

IX. අනු නීති මනාව පිළිගත් සිද්ධාන්තවලට හා නීතියේ මහිමයට අනුකූල වන බව සුරක්ෂිත කිරීමේ අදහසින්, පාර්ලිමේන්තුව නොවන වෙනත් මණ්ඩල විසින්, අනු නීති සෑදීමේ බලය ක්‍රියාත්මක කිරීම නිරන්තරයෙන් සමාලෝචනය කිරීම.

X. නඩුකීම හා සම්බන්ධ පරිපාලනාත්මක ස්වභාවයේ කාර්ය පටිපාටිය ඇතුළුව නීති කාර්ය පටිපාටි තර්කාපණය කිරීම හා සරල කිරීම සඳහා වැඩසටහන් ක්‍රමානුකූලව සකස් කිරීම.

XI. සිංහල භාෂාවෙන්, දමිළ භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් නීතිය සංග්‍රහ ගත කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම.

## 05. 2015.01.01 සිට 2015.12.31 දක්වා කාලසීමාව තුළ කාර්ය සාධනය.

### ජනවාරි - පෙබරවාරි

මෙම කාලය තුළදී නීති කොමිෂන් සභාවේ රැස්වීම් පවත්වා නොමැත.

### මාර්තු - 2015.03.28.

නීති කොමිෂන් සභාවේ නව සමාජිකයන් ලෙස පහත නම් දක්වා ඇති අය පත් කරන ලදී.

1. ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතා ( සභාපති)
2. මහාචාර්ය ලක්ෂ්මන් මාරසිංහ මහතා
3. ජනාධිපති නීතිඥ පාලිත ප්‍රනාන්දු මහතා
4. ජේ. එම්. ස්වාමිනාදන් මහතා
5. එන්. සෙල්වකුමාරන් මහතා
6. ජනාධිපති නීතිඥ එම්. ඉක්‍රම් මොහොමඩ් මහතා
7. ජනාධිපති නීතිඥ එස්. අනිල් සිල්වා මහතා
8. ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා
9. ජනාධිපති නීතිඥ මනෝහාර ද සිල්වා මහතා
10. ජනාධිපති නීතිඥ සංජීව පී. ජයවර්ධන මහතා
11. ධාරණි එස්. විජේතිලක මිය
12. මහාචාර්ය කාමිනා ගුණරත්න මිය
13. ජී. ජී. අරුල්ප්‍රගාසම් මහතා
14. තිසත් විජේගුණවර්ධන මහතා
15. නවින් සූරත් මාරපන මහතා

පළමු රැස්වීම 2015 මාර්තු මස 28 වන දින පවත්වන ලදී.

2015 වර්ෂය සඳහා, කලින් පැවති නීති කොමිෂන් සභාවේ අනුමත වූ වැඩසටහනම පවත්වාගෙන යාම සඳහා නව නීති කොමිෂන් සභාව එකඟ වූ අතර මතු දක්වා ඇති නීතිමය කරුණු සම්බන්ධයෙන් සලකා බැලීමටද යෝජනා විය.

- ඇප පනත.
- බෙදුම් පනත.
- ළමයින්ගේ රැකවරණය.
- විවාහ විය හැකි වයස.
- ත්‍යාග ඔප්පු ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම.

- පැරේට් ඇස්කිසිය.
- ශ්‍රේෂ්ඨාධිකරණ රීති සංශෝධන.

## අප්‍රේල් - 2015.04.26

අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් මහජනතාවගෙන් සහ වෘත්තීමය සංගම් මගින් අදහස් විමසීම සඳහා නීති කොමිෂන් සභාව එකඟ විය.

අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් මහජනයා හට තම අදහස් යොමු කරනු පිණිස නීති කොමිෂන් සභාව මගින් මතු දැක්වෙන පුවත්පත් මගින් දැන්වීම් පළකරනු ලැබීය.

| | | |
|---|---|---|
| සිළුමිණ | - | 2015.04.26 |
| සන්ඩේ ඔබ්සර්වර් | - | 2015.04.26 |
| තිනකරන් | - | 2015.04.26. |

## මැයි - 2015.05.15.

- **පරවේණි නිළකාරයා හට බෙදුම් නඩුකරයක් ගොණු කිරීමට ඇති අයිතිය.**

1951 අංක 16 දරන බෙදුම් පනත සංශෝධනය සඳහා නීති කොමිෂන් සභාවේ සාමාජිකයකු වන නවීන් මාරපන මහතා විසින් '*පරවේණි නිළකාරයා හට බෙදුම් නඩුකරයක් ගොණු කිරීමට ඇති අයිතිය*' යන මැයෙන් යෝජනා පත්‍රයක් ඉදිරිපත් කරන ලදී.

කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන පර්යේෂණ අංශ අනාගත රැස්වීම්වලදී සාකච්ඡා කිරීම පිණිස යෝජනා කරනු ලැබිණ.

1. සමාජ වෙබ් අඩවි සහ පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිවාසිකම
2. ශ්‍රේෂ්ඨාධිකරණ රීති සංශෝධන.

- **2011 අංක 2 දරන අධිවේගී මාර්ග රෙගුලාසි.**

නීති කොමිෂන් සභාව වෙත ටී. පර්නින්පනයාගම් මහතා විසින් '*2011 අංක 2 දරන අධිවේගී මාර්ග රෙගුලාසි*' යන මැයෙන් යෝජනා පත්‍රයක් ඉදිරිපත් කරන ලදී.

- **ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් වන දඬුවම් කිරීමේ ක්‍රියාමාර්ගය.**

මහාචාර්ය කාමිනා ගුණරත්න මිය සහ ධාරණී එස්. විජේතිලක මිය විසින් '*ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් වන දඬුවම් කිරීමේ ක්‍රියාමාර්ගය*' සඳහා කලින් පැවති නීති කොමිෂන් සභාව විසින් දෙනු ලැබූ නිර්දේශයන් නැවත සලකා බැලීමට ඉල්ලීමක් කළෝය.

## මැයි -2015.05.28.

- **පරවේණි නිළකාරයා හට බෙදුම් නඩුකරයක් ගොණු කිරීමට ඇති අයිතිය.**

අධිකරණ අමාත්‍යවරයා වෙත *(පරවේණි නිළකාරයා හට බෙදුම් නඩුකරයක් ගොණු කිරීමට ඇති අයිතිය)* බෙදුම් නීතිය සම්බන්ධයෙන් වන යෝජිත සංශෝධන සහිත කෙටුම්පත ඉදිරිපත් කිරීම සඳහා නීති කොමිෂන් සභාව එකඟ විය.

- **<u>වෙනස් කළ නොහැකි ත්‍යාග ඔප්පු ප්‍රත්‍යාදිෂ්ය කිරීම.</u>**

සද්භාවයෙන් යුතු ගැනුම්කරුවන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම උදෙසා *වෙනස් කළ නොහැකි ත්‍යාග ඔප්පු ප්‍රත්‍යාදිෂ්ය කිරීම* සම්බන්ධයෙන් ආරක්ෂක අන්තර් වාක්‍ය කෙටුම්පත් ගත කිරීමටත් බෙදුම් පනත නැවත සලකා බැලීමටත් නීති කොමිෂන් සභාව එකඟ විය.

- **<u>සමාජ වෙබ් අඩවි සහ පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිවාසිකම.</u>**

ජේ. එම්. ස්වාමිනාදන් මහතා සහ ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා විසින් සම්පාදිත *සමාජ වෙබ් අඩවි සහ පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිවාසිකම* සම්බන්ධයෙන් වන සංශෝධන සහිත කෙටුම්පත සභා ගතකොට සාකච්ඡා කෙරුණි.

- **<u>ශ්‍රේෂ්ඨාධිකරණ රීති සංශෝධන.</u>**

නීති කොමිෂන් සභාවේ සභාපති තුමා විසින් ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතාට *ශ්‍රේෂ්ඨාධිකරණ රීති සංශෝධන* සම්බන්ධයෙන් යෝජනා පත්‍රයක් කෙටුම්පත් ගත කිරීමට උපදෙස් ලබා දුන්නේය.

## <u>ජූනි - 2015.06.26</u>

- **<u>අභියාචනාධිකරණ සම්බන්ධයෙන් වන සංශෝධනය (1990 ඇපැල් ක්‍රියාපටිපාටි නීතිය).</u>**

ජනාධිපති නීතිඥ මනෝහාර ද සිල්වා මහතා විසින් සම්පාදනය කරන ලද *අභියාචනාධිකරණ සම්බන්ධයෙන් වන සංශෝධනය (1990 ඇපැල් ක්‍රියාපටිපාටි නීතිය)* සඳහා යෝජිත සංශෝධන සහිත කෙටුම්පත සාකච්ඡාකොට සම්මත කෙරුණි.

පහත දක්වා ඇති මාතෘකා ද සාකච්ඡා කෙරුණි.

- පෞද්ගලිකභාවය උල්ලංඝනය සඳහා දඬුවම.
- විද්‍යුත් මාර්ග හරහා ලිංගික කාර්ය නියෝජනය කෙරෙන ක්‍රියාවක් ප්‍රකාශයට පත්කිරීම හෝ විකාශනය කිරීම සඳහා දඬුවම.
- විද්‍යුත් මාර්ග හරහා ලිංගික කාර්ය නියෝජනය කෙරෙන ක්‍රියාවක ළමුන් ඇක්වෙන්නක් ප්‍රකාශයට පත්කිරීම හෝ විකාශනය කිරීම සඳහා දඬුවම.

## ජූලි - 2015.07.10.

- **වාවස්ථාපිත ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් වන දඬුවම් කිරීමේ ක්‍රියාමාර්ගය.**

*වාවස්ථාපිත ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් වන දඬුවම් කිරීමේ ක්‍රියාමාර්ගයෙහි* ඇති වැදගත්කම එම කරුණට පසුබිම හඳුනාගනිමින්, එය සංශෝධනය කිරීම පිණිස යෝජනා කළ හැකි උපරිම විසඳුම හඳුන්වා දීම පිළිබඳව සභාපති විසින් අවධානයට යොමු කළේය.

- **ජාතික ඖෂධ පාලන අධිකාරී පනත.**

මෙම පනත *1980 අංක 27 දරන සුවඳ විලවුන් සහ ඖෂධ පනත* ඉවත්කොට, 2015 මාර්තු මස 19 වන දිනදී සහතික කරන ලද *2015 අංක 05 දරන ජාතික ඖෂධ පාලන අධිකාරී පනත* යනුවෙන් ආදේශ කර ඇති බව ජේ. එම්. ස්වාමිනාදන් මහතා විසින් කොමිෂන් සභාවේ අවධානයට ගෙන ආවේය. 2015 අංක 05 දරන පනත ඖෂධ, සුවඳ විලවුන් සහ එහි අර්ථ නිරූපන සීමාවේ ඇති නිශ්පාදනයන් පිළිබඳ විස්තර කරයි. මෙම පනත මගින් සුවඳ විලවුන් ලියාපදිංචි කිරීමක් සම්බන්ධව විධිවිධාන දක්වා නොමැති බව හා එමගින් මහජනතාවට හානිකර බලපෑමක් ඇති කරවිය හැකි බව කොමිෂන් සභාවේ අවධානයට ලක් කරන ලදී .

ඉහත කරුණ සලකා බැලීමෙන් අනතුරුව, සුවඳ විලවුන් ලියාපදිංචි කිරීම සපයාදීම සම්බන්ධයෙන් කුමන ව්‍යවස්ථාවක් ඉදිරිපත් කළ යුතුද යන්න සොයාබැලීමට නීති කොමිෂන් සභාව එකඟ වුණි.

## ජූලි - 2015.07.30

- **වගකීම සීමිත හවුල් ව්‍යාපාර නීතිය පිළිබඳ සංශෝධන .**

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය ( ICASL ) කළ ඉල්ලීමට අනුව, *වගකීම සීමිත හවුල් ව්‍යාපාර* සම්බන්ධයෙන් වන කලින් පැවති නීති කොමිෂන් සභාව මගින් දක්වන ලද නීති ප්‍රතිසංස්කරණ නිර්දේශ නැවත සලකා බැලීමට නීති කොමිෂන් සභාව එකඟ වුණි.

- **මෝටර් රථ වාහන පනත සංශෝධනය.**

ජනාධිපති නීතිඥ සංජීව පී. ජයවර්ධන මහතා විසින් පොදු ගමනාගමනය වෙනුවෙන් නොසැලකිලිමත් රිය ධාවනය අවම කිරීම සහ වගකීම ඇතුලත් කර *මෝටර් රථ වාහන පනත* සංශෝධනය කිරීමට යෝජනා කරන ලදී.

## සැප්තැම්බර් - 04.09.2015

- **සමාජ වෙබ් අඩවි සහ පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිවාසිකම.**

"පෞද්ගලිකත්වය උල්ලංඝනය සඳහා දඬුවම්" සම්බන්ධව වන පර්යේෂණ ලිපිය සාකච්ඡා කරන ලදී.

## සැප්තැම්බර් - 17.09.2015

- **බෙදුම්පනත.**

බෙදුම් පනත සඳහා වූ යෝජිත සංශෝධනය අවසාන කරන ලදී.

- **ශ්‍රේෂ්ඨාධිකරන රීති.**

අභියාචනාධිකරන සම්බන්ධයෙන් වන යෝජිත සංශෝධන ( 1990 ඇපැල් ක්‍රියාපටිපාටි නීතිය) සම්බන්ධයෙන් වන වැඩිදියුණු කරන ලද කෙටුම්පත අවසාන කරන ලදී.

- **වෙනස් කළ නොහැකි ත්‍යාග ඔප්පු ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම.**

යෝජිත කෙටුම්පත අවසාන කරන ලදී.

## ඔක්තෝබර් - 2015.10.16

සමාජ වෙබ් අඩවි සහ පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිවාසිකම සම්බන්ධයෙන් වෘත්තිකයන්ගේ සහ ඒ පිළිබඳව විශේෂ උනන්දුවක් ඇති අයවලුන්ගේ අදහස් බෙදා ගැනීම අරමුණුකොටගෙන 16.10.2015 වන දින රැස්වීමක් පවත්වන ලදී. පහත නම් සඳහන් නියෝජිතයන් ඒ සඳහා සහභාගී විය.

1/ එස්. බාලපටබැඳි මයා, නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්, නීතිපති දෙපාර්තමේන්තුව.

2/සුමති ධර්මවර්ධන මයා, නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්, නීතිපති දෙපාර්තමේන්තුව.

3/ සාලිය පීරිස් මයා, උප සභාපති, නීතිඥ සංගමය.

4/ දොඩවත්ත මයා, ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

## ඔක්තෝබර් -2015.10.19

19/10/2015 වන දින ගරු අධිකරණ අමාත්‍යතුමාගේ ආරාධනය මත නීති කොමිෂන් සභා සාමාජිකයන් විසින් එතුමා හමුවන ලදී.

එම රැස්වීමේදී, කොමිෂන් සභාව මගින් අමාත්‍යවරයා වෙත මතු දැක්වෙන කරුණු ඉදිරිපත් කෙරුණි.

- බෙදුම් නීතිය සඳහා යෝජිත සංශෝධන.
- පෞද්ගලිකභාවය සම්බන්ධයෙන් වන නීතිය උදෙසා යෝජනා කෙරුණු පෞද්ගලිකභාවය උල්ලංඝනය කිරීම් විය හැකි අවස්ථා.
- ත්‍යාග නීතිය සම්බන්ධයෙන් වනයෝජිත ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම.
- මෝටර් රථ වාහන සඳහා වන සංශෝධනයක්.
- ශ්‍රේෂ්ඨාධිකරණ රීති සඳහාවන සංශෝධනයක්.

පහත දක්වා ඇති කරුණු සම්බන්ධව ද සොයා බලන ලෙසට කොමිෂන් සභාව වෙත අමාත්‍යවරයා ඉල්ලීමක් කළේය.

1/ අල්ලස් පනත සඳහා වන සංශෝධනය.

2/ උකස් පනත සඳහා වන සංශෝධනය.

3/ සිවිල් නඩු විධාන සංග්‍රහය සඳහා වන සංශෝධනය.

## නොවැම්බර් -2015.11.20

ඉදිරියේදී පැවැත්වීමට නියමිත නීති කොමිෂන් සභා රැස්වීම්වලදී සාකච්ඡා කිරීම පිණිස මතු දක්වා ඇති විෂය පථයන් සම්බන්ධයෙන්කොමිෂන් සභා සාමාජිකයන් නව යෝජනා ඉදිරිපත් කළහ.

- කුලීපනත සඳහා වන සංශෝධනය.
- සිවිල් නඩු විධාන සංග්‍රහය සඳහා වන සංශෝධනය.
- පවතින දික්කසාද කාර්ය පටිපාටිය සඳහා වන සංශෝධනය.

## දෙසැම්බර් -2015.12.08

විදේශ කටයුතු සම්බන්ධ ගරුඅමාත්‍ය සහ සංවර්ධන ක්‍රමෝපායන් සහ අන්තර්ජාතික වෙළඳ කටයුතුසම්බන්ධගරුඅමාත්‍ය යන අමාත්‍යතුමන්ලාගේ සභාපතීත්වයෙන් 18/11/2015 වන දිනදී, වෙළඳ හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේදී, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සඳහා වන යෝජිත සංශෝධන සම්බන්ධයෙන් රැස්වීමක් පවත්වන ලදී.ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සඳහා වන යෝජිත සංශෝධන සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලබන ආකාරය දක්වා කෙටුම්පතක් සැකසීමට කොමිෂන් සභාව එකඟත්වයකට පැමිණියහ.

## දෙසැම්බර් -2015.12.18

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සඳහා වන යෝජිත සංශෝධන සම්බන්ධයෙන් වන්නාවූ අදහස් බෙදාගැනීම සඳහා රැස්වීමක් පවත්වන ලදී. පහත නම් දක්වා ඇති නියෝජිතයන් මේ සඳහා සහභාගී විය.

1/ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන් මයා.

2/ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී උදය ගම්මන්පිල මයා.

3/ ජනාධිපති නීතිඥ ශවීන්ද්‍ර ප්‍රනාන්දු මයා, අතිරේක සොලිසිටර් ජෙනරාල්.

4/ ජනාධිපති නීතිඥ යසන්ත කෝදාගොඩ මයා, අතිරේක සොලිසිටර් ජෙනරාල්.

5/ ජනාධිපති නීතිඥ ජෙෆ්රි අලගරත්නම් මයා, සභාපති, ශ්‍රී ලංකා නීතිඥ සංගමය.

6/ රජයේ නීතිඥ අසාඩ් නවාවි මයා.

## 06. මූල්‍යමය ප්‍රගතිය (2015.01.01 සිට 2015.12.31 දක්වා).

( ප්‍රාග්ධන සහ පුනරාවර්තන)

| විස්තරය | 2015 සඳහා වෙන්කිරීම් | 2015 දෙසැම්බර් 31 වන දිනට වියදම | % |
|---|---|---|---|
| ප්‍රාග්ධන වියදම | 2,000,000 | 1,131,702 | 56.59% |
| පුනරාවර්තන වියදම | 15,000,000 | 10,163,305 | 67.76% |
| එකතුව | **17,000,000** | **11,295,007** | **66.44%** |